# ගැඩවිලි පණු පොහොර හෙවත් වර්මි කොම්පෝස්ට් (Vermi Composting) නිෂ්පාදනය

"අපි වවමු - රට නගමු" වැඩ සටහනට අතිශයින් අවශ්‍ය වන, එමෙන්ම ඒ හා සම්බන්ධව ගොවි ජනතාවට ඉමහත් ප්‍රයෝජනයක් අත්කර ගත හැකි අංශයක් වන්නේ ගැඩවිල් පණු පොහොර හෙවත් වර්මි කොම්පෝස්ට් (Vermi Composting) නිෂ්පාදනයයි.

තවදුරටත් මෙම ක්‍රියාවලිය පැහැදිළි කරන්නේ නම් ගැඩවිල් පණුවන් ආධාරයෙන් බෝග අවශේෂ සත්ත්ව අපද්‍රව්‍ය, මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය වැනි කාබනික අපද්‍රව්‍ය වියෝජනයට ලක් කිරීමෙන් කොම්පෝස්ට් සෑදීම Vermi Composting වේ.

මෙම ගැඩවිලි පණු පොහොර නැතිනම් වර්මි කොම්පෝස්ට් ඉතා උසස් තත්ත්වයේ කාබනික පොහොරක් ලෙස වගාවට යොදා ගැනීමේ හැකියාව පවතී.

**ගැඩවිලි පණු පොහොර / වර්මි කොම්පෝස්ට්වල වාසි**

* අපද්‍රව්‍ය චක්‍රීකරණයට උදව් වීම.
* පරිසර දූෂණය අවම කිරීම
* Protease, lipase, cellulase, chitinase වැනි එන්සයිම අඩංගු වීම නිසා ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය වැඩිවීම.
* විටමින්, antibiotics නැතිනම් ප්‍රතිජීවක වර්ධක හෝමෝන අඩංගු වීම
* රෝග කාරක වලින් තොරවීම
* පසේ ව්‍යුහය දියුණු කිරීම.
* සච්ඡිද්‍රතාවය, පාංශු වාතනය, ජල වහනය, ජලය රඳවා ගැනීමේ හැකියාව වර්ධනය.

**ගෙවතු කොම්පෝස්ට් හා වර්මි කොම්පෝස්ට් සන්සන්දනය**

| පරාමිතීන් | ගෙවතු කොම්පෝස්ට් | වර්මි කොම්පෝසට් |
|---|---|---|
| PH | 7.80 | 7.5 |
| EC (mmhos/cm) | 3.60 | 11.70 |
| Total kjedahl N(%) | 0.80 | 1.94 |
| Nitrate N(ppm) | 156.50 | 902.20 |
| Phosphorous% | 0.35 | 0.47 |
| Potasium % | 0.48 | 0.70 |
| Calcium % | 2.27 | 4.40 |
| Sodium % | <0.01 | 0.02 |
| Magnecium % | 0.57 | 0.46 |

**වර්මි කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා සුදුසු පරිසර තත්ත්වයන්**


- හොඳ සෙවන සහිත ස්ථානයක්
- බළලුන්, බල්ලන්, කුරුල්ලන් හා කුහුඹින්ගෙන් ආරක්ෂා සහිත ස්ථානයක්
- හොඳින් ජල වහනය සිදුවන ස්ථානයක්

**වර්මි කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා සුදුසු ගැඩවිල් පණු වර්ග**

වර්මි කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා බහුල වශයෙන් යොදා ගන්නා ගැඩවිල් පණු වර්ග 03 කි.

(i) Eudrilus eugeniae (*African Night Crawler*)
(ii) Eisenia foetida (*Red worm, tiger worm, Pink worm, Brandlin worm*) බහුල වශයෙන් යොදා ගැනේ.
(iii) Perionyx excavatus (*India Blues*)

> මා වැඩ කරන විට දෙවියන් වහන්සේ මට ගෞරව කරයි. එහෙත් මා ගී ගායනය කරන විට උන්වහන්සේ මට ආදරය කරයි
>
> - රබීන්ද්‍රනාත් තාගෝර් -




**පණු පොහොර ආදර්ශනය**

ගොමවල වෙසෙන කුඩා රතු ගැඩවිල් පණුවන් මේ සඳහා යොදාගත හැකි වේ.

### වර්මි කොම්පෝස්ට් සාදා ගන්නා ආකාරය

***අවශ්‍ය ද්‍රව්‍ය :-***

ගොම
බෝග අවශේෂ
ගෙවත්තේ කුණු රොඩු
කුස්සියෙන් ඉවතලන දෑ (ලූණු, සුදු ළූණු, පැඟිරි, කුළුබඩු වැනි ද්‍රව්‍ය වල අපද්‍රව්‍ය සුදුසු නැත)

***මිශ්‍ර කරන අනුපාතය***

ගොම : දිරායන ශාක කොටස් 1:1, 1:2, 1:3

ගොම අනුපාතය වැඩි වූ විට හා ශාක කොටස් කුඩා කැබලි ලෙස යොදා ගත් විට කොම්පෝස්ට් නිෂ්පාදනය වේගවත් වේ.

### වර්මි කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කරන ක්‍රම

- වල ක්‍රමය
- ටැංකි ක්‍රමය
- පණු දියර නිෂ්පාදනය

### වල ක්‍රමය

හොඳින් ජල වහනය සිදුවන සෙවන සහිත ස්ථානයක අඩි 06 x අඩි 03 x අඩි 03 පරිමාණයේ වලක් කපා ගන්න.

## වල පිළියෙල කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය

- අගල් 04 විෂ්කම්භය ඇති ගඩොල් හෝ ගල් කැබලි
- අගල් 01 විෂ්කම්භය ඇති ගඩොල් හෝ ගල් කැබලි
- ගංගා වැලි
- මතුපිට පස්
- ගොම හා දිරායන ශාක කොටස්

## වර්මි කොම්පෝස්ට් වලක්

අගල් 04 ක පමණ ඝණකමට සිටින සේ පිළිවෙලින් ලොකු ගල් ස්ථරයක්, පොඩි ගල් ස්ථරයක් හා ගංගා වැලි ස්ථරයක් වශයෙන් ස්ථර 03 ක් රූප සටහනේ දැක්වෙන ආකාරයට අතුරන්න. ඉන්පසු, මතුපිට පස් අගල් 08 ක පමණ ස්ථරයක් යොදන්න. එය මත සාදාගත් ගොම හා දිරා යන ශාක කොටස් මිශ්‍රනයෙන් අඩි 02 පමණ යොදන්න.

අව්වෙන් හා වැස්සෙන් ආරක්ෂාවීමට ඉහළින් පොල් අතු වහලක් සකසන්න.

ගොම හා ශාක කොටස් සහිත ස්ථරය උස අඩි 1-2 අතර උස මට්ටමක පවත්වා ගත යුතු අතර ජලය දමා තෙත්ව තබා ගන්න.

සතියකට වරක් සිහින් කෝටුවක් ගෙන සෙමෙන් කළවම් කරන්න.

ගැඩවිල් පණුවන් ගොම හා ශාක කොටස් ආහාරයට ගැනීම හේතු කොටගෙන ගොඩෙහි උස අඩුවන විට ආහාර එකතු කරමින් අඩි 1-2 මට්ටමේ පවත්වා ගන්න.

සති 03 කට පසු ආහාර දීම නවත්වන්න. සති 4-5 දී පමණ පණු පොහොර ලබාගත හැකි අතර පොහොර ලබා ගැනීමට දවස් 4-5 කට පෙර වතුර යෙදීම නවත්වන්න.

එම අවස්ථාවේදී අවම වශයෙන් වර්ග අඩියකට පණුවන් 1000/ ග්‍රෑම් 450 පමණ සිටිය යුතුය.

## කොම්පෝස්ට් ලබා ගැනීමේදී ගැඩවිල් පණුවන් ඉවත් කිරීමේ ක්‍රම

### *පළමු ක්‍රමය*

පණුවන් සහිත කොම්පෝස්ට් වලේ එක් පැත්තකට ගොඩ ගසන්න. හිස් කොටසකට අලුතින් ගොම හා ශාක කොටස් සහිත අලුත් ආහාර එකතු කරන්න. එවිට අලුත් ආහාර වලට ගැඩවිල් පණුවන් සියල්ල දින 2-3 කදී පැමිණේ. එවිට පොහොර ඉවත් කර ගත හැකි වේ.

### *දෙවන ක්‍රමය*

කොම්පෝස්ට් ටික කන්දක් ලෙස හොඳින් හිරු එළිය වැටෙන ස්ථානයක ගොඩ ගසන්න. එවිට පණුවන් හිරු එළියෙන් බේරීමට ගොඩ පහළට ගමන් කරයි. අනතුරුව මිනිත්තු 10 කාල සීමා වල දී අගල් 01 තට්ටු ලෙස කොම්පෝස්ට් ඉවත් කර ගැනීමේ හැකියාව ලැබේ.

### *තෙවන ක්‍රමය*

දැලක් සහිත සල්අඩයකින් හලාගෙන කොම්පෝස්ට් ඉවත් කර ගත හැකිය. ලොකු කැබලි නැවත වලට දමන්න.


## වර්මි කොම්පෝස්ට් සෑදීමේදී සැළකිය යුතු කරුණු

**අ.** පණුවන්ගේ විලෝපිතයන්ගෙන් පණුවන් ආරක්ෂා කිරීම. නිද: කුරුල්ලන්, මීයන්, ගොලුබෙල්ලන්, පත්තෑයන්, ගැඩවිල් මයිටාවන්.

**ආ.** දුර්ගන්ධයන් ඇතිවීම
- අනවශ්‍ය ලෙස ආහාර එකතු කිරීම
- තෙතමනය වැඩිවීම

### ටැංකි ක්‍රමය

අවම පරිමාණය අඩි 2 x අඩි 2 x අඩි 3




ගැඩවිල් පණු පොහොර ටැංකිය

### පණු දියර නිෂ්පාදනය

ගැඩවිල් පණුවන් ආධාරයෙන් කාබනික අපද්‍රව්‍ය වියෝජනයට ලක් කිරීමෙන් ලැබෙන කොම්පෝස්ට් දියරය ඉතා උසස් දියර පොහොරක් ලෙස භාවිතා කළ හැකිය.

මේ සඳහා පියන සහිත ප්ලාස්ටික් බඳුන් හෝ සිමෙන්තියෙන් සාදාගත් ටැංකි භාවිතා කිරීමේ හැකියාව පවතී.

මේ ආකාරයට පණු දියර බේසමක් වුව ද සකසා ගත හැකිය.

මාස 06 ක් පමණ පණු දියර ලබා ගැනීමෙන් ඉතිරි වන දිරාගිය කොටස් ද පොහොරක් ලෙස යොදා ගත හැකිය.


**එම්.ජී. අජිත් පුෂ්පකුමාර**
*කථිකාචාර්ය*
**සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය,**
**අඟුණකොළපැලැස්ස.**


---

## ගොවි ජනතා - ඉදිරි කලාපය

**"අපි වවමු - රට නගමු"**, දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම අළලා ලියැවුන තවත් වටිනා හර-බර ලිපි රැසකින් සමන්විත වේ. එබැවින්, මේ සඳහා ඔබට ද දායකවීමේ අවස්ථාව තවදුරටත් පවතී. ඔබගේ ලිපි ඒ$_4$ තනි පිටුවෙහි ලියා පහත සඳහන් ලිපිනයට අප වෙත ලැබෙන්නට සලස්වන්න.


සංස්කාරක
ගොවි ජනතා
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ - 07.